# රබර් ඉඩම්වල අන්නාසි වගා කිරීම

යූ. ඩී. වී. ගුණසිංහ විසිනි
(රබර් උපදේශක—ගම්පහ)

## හැඳින්වීම

මිහිරි රසයෙන් හා ගුණයෙන් පිරි හොඳ පළතුරු වර්ගයක් වශයෙන් අන්නාසි මෙරට මෙන්ම විදේශ රටවලද ජනප්‍රිය වී ඇත. ටින්වල අසුරන ලද අන්නාසි කල්තබා ගැනීමට හැකි නිසා විදේශ වෙළඳ පොලටද යවා අප රටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීමටද හැකිවී ඇත. මෑත භාගයේදී ශ්‍රී ලංකා අන්නාසි සඳහා එතෙරින් ලැබෙන ඉල්ලුම අධික නිසා ඊට සරිලන පරිදි අප රටේ අන්නාසි වගාව දියුණු කිරීම ප්‍රයෝජනවත් වේ. මෑතක් වනතුරු අන්නාසි අතුරු වගාවක් වශයෙන් පොල් ඉඩම්වල පමණක් වගා කරන ලද මුත් දැන් රබර් වගාකරන ඉඩම්වලද අන්නාසි අතුරු බෝගයක් වශයෙන් වගා කිරීමෙන්, අන්නාසි පඳුරු සරුවට වැඩී හොඳ ඵලදාවක් ලැබෙන බැව් පෙනී ගොස් ඇත.

නැවත වගා කරන හෝ අළුතෙන් රබර් වගා කරනු ලබන ඉඩම්වල අතිරේක බෝගයක් වශයෙන් අන්නාසි වගා කිරීමෙන් විශාල අමතර ආදායමක් ලබාගත හැක. පසුගිය අවුරුදු කීපය තුල කොළඹ දිස්ත්‍රික්කයේ, ගම්පහ අවට රබර් ඉඩම් හිමියන් කීපදෙනෙකු රබර් සමග අන්නාසි වගාකර සාර්ථක ප්‍රතිඵල ලබා ඇති අතර ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය මගින් අත්හද බැලීම් වශයෙන් කුඩා රබර් ඉඩම් හිමියන්ගේ අනුග්‍රහය ඇතිව ජාඇල, නිවන්දම වගා කරන ලද ඉඩම් වලින්ද මේ බව මනාව ඔප්පුවී ඇත.

අතිරේක වගාවක් වශයෙන් රබර් ඉඩම් වල අන්නාසි වගා කිරීමෙන් අවුරුදු 4 ක පමණ කාලයක් තුල හොඳ ආදායමක් ලබාගත හැකි වන අතර එයින් අත්වන ප්‍රයෝජන රැසකි. ඒවා නම් : පස සේදී යාම වැලකීම, වල් පැලෑටි මර්දනය, පසට ජලය උරා ගැනීම වැඩිවීම, දිරා යන අන්නාසි කොල සහ මුල් නිසා පසට ඓන්ද්‍රිය පොහොර එකතු වීමෙන් පස සාරවත් වීම, ආදියයි.

රබර් වගා කරනු ලබන ඉඩම්වල ආවරණ වැල් වගා කිරීම අනිවාර්ය මුත් අන්නාසි වගා කරන්නේ නම් ආවරණ වැල් වගා කිරීම අවශ්‍ය නොවනු ඇත.

අතිරේක වගාවන් වශයෙන්, රබර් ඉඩම්වල අන්නාසි වගා කිරීම සඳහා කොළඹ, කළුතර, ගාල්ල, මාතර, කුරුණෑගල සහ මොණරාගල දිස්ත්‍රික්කයන්හි රබර් ඉඩම් හිමියනට රබර් පාලකගෙන් අවසර ලබාගත හැක.

## ඉඩම් සකස් කිරීම

ඉඩම් පිරිසිදු කිරීමෙන් පසු ට්‍රැක්ටරයක් මගින් හෝ පොලව කෙටීමෙන් හෝ පස හොඳින් බුරුල් කර ගත යුතුයි. ඉන්පසු පසෙහි වන පරණ මුල් සහ ගල් හැකි පමණ ඉවත් කොට වල ගොඩැලි සමතලා කළ යුතුයි. ඉඩම වටේ අඩි 2ක් පළල අඩි 1 ක් ගැඹුර කාණුවක් කැපීම ප්‍රයෝජනවත්ය.

## රබර් පැල සිටුවීම සඳහා වලවල් කැපීම

රබර් පැල සිටුවීම සඳහා සමතලා ඉඩමක නම් පේලි ක්‍රමයටත් බෑවුම් සහිත ඉඩමක නම් සම මට්ටම් ක්‍රමයටත් අඩි 20 × 12 දුර ප්‍රමාණයට වලවල් කැපීම සුදුසුය. රබර් පැලවල වැඩීමට බාධා නොවන සේ අන්නාසි පැල, රබර් පැල වලට අඩි 4 ක් පමණ ඈතින් සිටුවිය යුතුය. මෙ නිසා සමමට්ටම් ක්‍රමයට රබර් පැල සිටුවීම සඳහා වලවල් කැපීමේදී මොනයම් හේතුවක් නිසාවත් රබර් වලවල් පේලි අතර පරතරය අඩි 18 කට වඩා අඩු නොවිය යුතුය.

## අන්නාසි සිටුවීම සඳහා පොලව සකස් කිරීම

අන්නාසි සිටුවීම සඳහා අඟල් 6 ක් පළල අඟල් 6 ක් ගැඹුර සමමට්ටම් ක්‍රමයට රබර් පැල සිටුවීමට කැපූ වලවල් පේලි අතර කාණු කැපිය යුතුයි. රබර් පැල පේලි අතර පරතරය අඩි 20 ක් වන විට පේලි දෙකක් අතර අන්නාසි පේලි තුනක් සිටුවිය හැක. පලමුවෙනි අන්නාසි

පෙල රබර් පැල සඳහා වූ වලවල් පෙලේ සිට අඩි 4 ක් ඇතින්ද, දෙවෙනි අන්නාසි පෙල පලවෙනි අන්නාසි පෙලේ සිට අඩි 6 ක් ඇතින්ද, තුන්වන අන්නාසි පෙල දෙවෙනි අන්නාසි පෙලේ සිට අඩි 6 ක් ඇතින්ද විය යුතුය. තුන්වන අන්නාසි පෙලේ සිට ඊලඟ රබර් පැල සිටුවීමේ වලවල් පෙලට අඩි හතරක්ද විය යුතුය. (රූප සටහන).

## අන්නාසි වර්ග

අන්නාසි වර්ග කීපයක් ඇතත් ''කිව්'' සහ ''මුරිසි'' ජනප්‍රිය අන්නාසි වර්ග දෙකවේ. ''කිව්'' වර්ගයේ පත්‍රවල කටු නොමැත. ගෙඩි ප්‍රමාණයෙන් විශාලය. අධික යුෂ සහිත මෙම වර්ගය ටින්වල ඇසිරීම සඳහා යෝග්‍ය වන අතර අලෙවි දෙපාර්තමේන්තුවේ ගබඩා වලට අලෙවි කළ හැක.

''මුරිසි'' වර්ගයේ පත්‍ර තියුනු කටු වලින් යුක්තය. ගෙඩි ''කිව්'' වර්ගයේ ගෙඩි වලට වඩා කුඩාය. රසවත්ය. පලතුරු වර්ගයක් වශයෙන් මෙරට වෙළඳ පොලේ හොඳ මිලක් ලබා ගත හැක.

## අන්නාසි පැල තෝරා ගැනීම

අන්නාසි පැල තෝරා ගැනීමේදී රෝග වලට පාත්‍ර නොවූ ඉඩමකින් හැකි පමණ දුරට සම ප්‍රමාණයට වැඩුන නිරෝගී පැල තෝරා ගැනීමට සැලකිලිමත් විය යුතුය. අක්කරයකට පැල 4000 ක් පමණ අවශ්‍ය වේ.

## අන්නාසි පැල සිටුවිය යුතු කාලය

අධික වර්ෂාව ඇති කාලය හැරුණු විට අවුරුද්දේ ඕනෑම කාලයක අන්නාසි සිටුවිය හැක. අධික වර්ෂා කාලයේ අන්නාසි සිටුවීමෙන් ගොබ කුණු වී මැරියාමට ඉඩ ඇත.

රබර් පැල වලට අවුරුදු 4 ක් පමණ වන විට අතු බෙදී පොලවට සෙවන වැටෙන කාලයේ දී අන්නාසි ගස්වල වැඩීම දුර්වල වේ. එමනිසා රබර් පැල සිටුවීමට මාස 6 කට පමණ පෙර අන්නාසි සිටුවන්නේ නම් අන්නාසි වගාවෙන් වැඩි කාලයක් ආදයම් ලබා ගත හැකි වනු ඇත.


## අන්නාසි පැල සිටුවීම

අන්නාසි වගාවට පිටි මකුණාගෙන් බෝවන අන්නාසි පඳුරු මැලවීයාමේ රෝගය මර්දනය කිරීම සඳහා සිටුවීමට පෙර අන්නාසි පැල රෝග බීජ නාශකයක ගිල්වා සිටුවිය යුතුය. මේ සඳහා ''සුමතියොන්'' දියර අවුන්සයක් වතුර ගැලුම් 6 කට මිශ්‍රකර අන්නාසි පැල සම්පූර්ණයෙන් ගිල්විය හැකි වන පරිදි එම මිශ්‍රණය ලොකු බැරලයකට සාදගන්න. වරකට පැල 5 ක් පමණ පත්‍ර පහතට සිටින සේ අල්ලා, මිශ්‍රණයේ ගිල්වා, මඳ වේලාවක් තබා ඉවතට ගෙන සතියක් පමණ සෙවන තැනක තබන්න. රෝග බීජ නාශක මිනිස් ශරීරයටද විෂ සහිත බැවින් පැල ඇල්ලීමේදී ආරක්ෂාව සලසාගත යුතුය.

ලොකු පැල සහ කුඩා පැල එක ලඟ සිටුවීමෙන් කුඩා පැලවල වැඩීම දුර්වල වේ. මේ නිසා අන්නාසි පැල ලොකු, මධ්‍යම සහ කුඩා යනුවෙන් කොටස් තුනකට වර්ග කරගත යුතුය.

කලින් පිළියෙල කරගත් කාණුවල, පැල අතර පරතරය අඟල් 18 ක් වන සේ, වර්ගකරගත් අන්නාසි පැල ඉඩමේ වෙන් වශයෙන් සිටුවිය යුතුය. බෑවුම සහිත ඉඩමක නම් අන්නාසි පැල බෑවුම් පැත්තට මදක් ඇලවනසේ තබා සිටුවීම මැනවි.

අන්නාසි පැල අතරට කොහුබත් දමන්නේ නම් වල් පැලෑටි වැඩීමක් ඇති නොවන අතර පොලවේ තෙතමනය රඳා පවතී. එහෙත් මේ සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන අතර අධික වර්ෂාව ඇති ප්‍රදේශවල මේ නිසා අන්නාසි වගාවන්ට ගස් මැලවී යාමේ රෝගය හට ගැනීමට ඉඩ ඇත.


6
4'
12'
4'
20'
6'
6'
4'
රබර් පැල
අන්නාසි පැල

## පස් සංරක්ෂණ ක්‍රම සැලසීම

සාමාන්‍ය බෑවුම් සහිත හෝ සමතලා ඉඩමක නම් අන්නාසි වගාව කරන තුරු පස් සංරක්ෂණ ක්‍රම අවශ්‍ය නොවේ. එහෙත් තද බෑවුම් සහිත ඉඩමක නම් අන්නාසි සහ රබර් සිටුවීමට කලින් කානු හෝ ගල් වැටි කීපයක් දැමිය යුතුය. අන්නාසි වගාව ඉවත් කල පසුද ක්‍රමවත්ව කානු හෝ ගල් වැටි දැමීමට වගබලා ගත යුතුය.

## අන්නාසි වගාවට පොර යෙදීම

අන්නාසි පැල සිටුවා මාස 3 කට පසු අක්කරයකට N:P:K—4:8:5 පොර හොණ්ඩර 15 ක් (පැලයකට අවුන්ස 6 ක් පමණ) යෙදිය යුතුය. අන්නාසි පැල පේලි දිගේ එක පැත්තකට පමණක් වැටෙන සේ මුල් අසලට පොර ඉස අඟල් 2 ක් පමණ ගැඹුරට පස සමග මිශ්‍ර කරන්න. මෙසේ කිරීමේදී පැලවල මුල් තදින් ඇවිස්සීමට ඉඩ නොතැබිය යුතුය.

අන්නාසි පැල සිටුවා 7 වෙනි මාසයේදී ද එම පොර මිශ්‍රණයෙන් හොණ්ඩර 15 ක් පෙර දැමූ පරිදිම අන්නාසි පේලි දිගේ අනික් පැත්තට දමා පස සමග මිශ්‍ර කරන්න.

අන්නාසි පැල සිටුවා 9 වෙනි මාසයේ දී ද එම පොර මිශ්‍රණයෙන් හොණ්ඩර 15 ක් පෙර පරිදිම අන්නාසි පැල පේලි දිගේ පලමු වර දැමූ පැත්තට දමා පස සමහ මිශ්‍ර කරන්න.

දෙවෙනි අවුරුද්දේ සිට ගෙඩි කඩා සති 6 කට පසු අක්කරයකට පොර හොණ්ඩර 20 බැගින් පැති මාරුකර ගස් මුලට දමා පස සමහ මිශ්‍ර කරන්න. අවුරුද්දකට දෙවරක් ගෙඩි කඩා ගත හැකි බැවින් අවුරුද්දකට දෙවරක් පොර දැමිය යුතුය.

## අන්නාසි වගාවෙ මල් හටගන්වා ගැනීම

හොඳින් වැඩුන සෑම අන්නාසි ඝසකම එකම කාලයේදී එල හට ගන්වා ගන්නේ නම් සතුන් ගෙන් ආරක්ෂා කර ගැනීමටත්, පහසුවෙන් අලෙවිකර ගැනීමටත් හැකි වන අතර, අවාරයේදී ලබන ගෙඩි වලින් උපරිම ලාභයක් ලබා ගැනීමටත් හැකි වෙනවා ඇත.

අන්නාසි පැල සිටවා 9 වෙනි මාසයේදී පමණ සම්පූර්ණයෙන් වැඩුන කොල 30 ක් පමණ තිබෙ නම, කෘත්‍රිම ක්‍රමයට මල් හට ගන්වා එකම කාලයේදී ගෙඩි කඩා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රම පාවිච්චි කළ හැක.

''කිව'' වර්ගයට: ''ඇසිටිලීන්'' වායුව අඩංගු දියරයක් යෙදීමෙන් ''කිව'' වර්ගයේ අන්නාසි ගස් වලින් එල හට ගන්වා ගත හැක. මේ සඳහා පහසුම ක්‍රමය නම් ''කාබයිඩ්'' අවුන්ස 6 ක් වතුර ගැලුම් 4 කට මිශ්‍රකර එම මිශ්‍රණයෙන් අඩු කෝප්පයකින් 1/3 ක් පමණ මිශ්‍රණය පිළියෙල කරගත් විගසම හොඳින් වැඩී ඇති ගස්වල කරටිය (ගොබය) තුලට වත් කිරීමයි. පැය 48 ක පමණ කාලයක් ගතවන තුරු වර්ෂාව නොතිබිය යුතුය. සති 6—8 කට පසු මල් හට ගනු ඇත. මාස 5 කින් පමණ ගෙඩි හොඳින් පැසෙයි.

''මුරිසි'' වර්ගයට: ''ඇල්ෆා—නැප්තලීන් ඇසිටික් අම්ලය'' අඩංගු ''ෂෙල්ස්ටොන්''—p—(Shellestone-p-) අවුන්ස 1 ක් වතුර ගැලුම් 12 කට මිශ්‍රකර එයින් අවුන්ස 2—2½ බැගින් හොඳින් වැඩී ඇති ගස්වල කරටිය (ගොබය) තුලට වත් කරන්න. පැය 48 ක් පමණ ගත වන තුරු වර්ෂාව නොතිබිය යුතුය. සති 6—8 කට පසු මල් හට ගනු ඇත. මාස 5 කින් පමණ ගෙඩි හොඳින් පැසෙයි.

ගෙඩිවල බර වැඩිකර ගැනීමට ''ෂෙල්ස්ටොන්''—p—(Shellestone-p-)අවුන්ස 4 ක් වතුර ගැලුම් 5 කට මිශ්‍ර කර ගෙඩිය පැසෙයයි සාමාන්‍යයෙන් බලාපොරොත්තු වන දිනට සති 8—9 කට කලින් ගෙඩි වලට ඉසින්න. මෙම දියර වැඩෙන පැල වලට වැටෙන්නට ඉඩ නොතබන්න.

## අන්නාසි ගෙඩි කැඩීම

පැසුනු අන්නාසි ගෙඩි කැඩීමේදී මිට දිග මුවහත් කැත්තක් වැනි ආයුධයකින් ගෙඩියේ නටුව ගසට සම්බන්ධ වූ ස්ථානයෙන්ම කපාගත යුතුය. ගෙඩියේ නටුව ගසට ඉතිරි වන සේ කපා ගතහොත් පසුව හැදෙන මොරෙයියන් (පැල) ගසේ ඉහලින් සැදී ගෙඩි හැදුන විට ගස් කඩා වැටෙන්නට ඉඩ ඇත.

ගෙඩි කඩාගත් පසු පහාදින් වැඩුන මොරෙයියන් 2—3 ගයට ඉතිරිවන්ට හැර වැඩි ඒවා කැඩිය යුතුයි. දෙවනි අවුරුද්දේ සිට අන්නාසි මොරෙයියන් විකිණිය හැක.

## අන්නාසි වගාවට ඇතිවිය හැකි රෝග

අන්නාසි වගාවන්ට වැලදෙන භයානකම රෝගය නම අන්නාසි පඳුරු මැලවීමෙ රෝගයයි. මෙය පිටි මකුණා විසින් අන්නාසි ගස් වලට විදිනු ලබන වෛරසයකින් හට ගන්නා අතර කුහුඹුවන් විසින් නිරෝගී ගස් වලටද එය පතුරුවා හරිනු ලබයි.

මෙම රෝගය වැළඳුන විට අන්නාසි කොළ දුඹුරු පැහැයක් ගෙන පසුව කහ පැහැයකට හැරී ගස් කඩා වැටී මුළුමනින්ම වියලී යයි.

අන්නාසි වගාවෙ පිටි මකුණන් සිටින බවට ලකුණු පහල වූ විගස ''සුමිතියොන්'' දියර අවුන්ස 1 ක් වතුර ගැලුම් 4 කට මිශ්‍රකර ගස් සම්පූර්ණයෙන් තෙමියන සේ ඉසීමෙන් ''පිටි මකුණන්'' සහ කුහුඹුවන් සාර්ථක ලෙස මර්දනය කල හැක.

## අන්නාසි වගාවට හානිකරවූ වෙනත් සතුන්

කපුටන්, ලේනුන් හා වෙනත් එවැනි සතුන් අන්නාසි ගෙඩි වලට හානි කරන අතර එවැනි සතුන් බිය ගන්වා පලවා හැරීමෙන් හෝ අන්නාසි ගෙඩි ගසේ කොලවලින් ආවරණය කර බැඳීමෙන් හෝ පිදුරු වලින් ආවරණය කිරීමෙන් හෝ ආරක්ෂා කරගත හැක.

## අන්නාසි වගාවෙ ආර්ථික පක්ෂය

රබර් වගා කරනු ලබන ඉඩම වල අතිරේක වගාවක් වශයෙන් අන්නාසි වගා කිරීම සඳහා අක්කරයකට රුපියල් 1,500 ක පමණ මූලික වියදමක්ද, පළමු අන්නාසි අස්වැන්න නෙලා ගන්නා කාලය දක්වා වල් පැලෑටි මර්දනයට සහ පොහොර යෙදීමට රුපියල් 1,700 ක පමණ වියදමක්ද දැරිය යුතුවෙ. එහෙත් 14 වෙනි මාසයේදී පමණ නෙලාගත හැකි පළමු අන්නාසි අස්වැන්නෙන් සියළුම වියදම් පියවා රුපියල් 500 ක පමණ ශුද්ධ ලාභයක් ලබාගත හැක.

දෙවන අවුරුද්දේ සිට අවුරුද්දකට දෙවරක් අස්වනු නෙලාගත හැකි වන අතර මොරෙයියන් විකිණීමෙන්ද අමතර ආදායමක් ලබා ගත හැක.

මෙ අනුව අන්නාසි වගා කර අවුරුදු 4 ක පමණ කාලයක් තුල රුපියල් 10,000 පමණ ශුද්ධ ආදායමක් ලබා ගත හැක.

පරණ රබර් ගස් උදුරා දැමීමෙන් පසු අළුත් රබර් වගාවේ ආදායම ලබා ගන්නා කාලය එළඹෙන තෙක් නොලැබී යන ආදායම අළුත් රබර් වගාවත් සමග අන්නාසි වගා කිරීමෙන් ලබාගත හැකි බැව් මෙයින් පැහැදිලි වේ.